## රුහුණ විශ්වවිද්‍යාලය

# පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

## ආර්ථික විද්‍යාව පශ්චාද් උපාධි පාඨමාලාව - 2023/2024 (SLQF 9 මට්ටම) සඳහා අයදුම්පත් කැඳවීම

## Master of Economics Degree Program

රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මඟින් මෙහෙයවනු ලබන ඉහත සඳහන් උපාධි පාඨමාලාවේ දහතුන් වන කණ්ඩායම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. පාඨමාලාවේ ලියාපදිංචියට අවශ්‍ය අවම සුදුසුකම්**

I. ආර්ථිකවිද්‍යාව විෂය ක්ෂේත්‍රයෙන් අවම වශයෙන් අර්ස 30 සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ

II. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් තිබීම හෝ

III. ඉහත I හෝ II ට සම කළ හැකි සහ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් සුදුසුකමක් තිබීම හෝ

IV. අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් හෝ සුදුසුකම් සහිතව NVQ-7 මට්ටම සමත් ව තිබීම හෝ

V. ශ්‍රී ලංකා රජය විසින් පිළිගන්නා වෘත්තීය සුදුසුකමක් සමඟ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්දක් තිබීම හෝ

VI. විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් සුදුසුකම් (විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතියට යටත්ව අවශ්‍ය නම් අපේක්ෂකයන් විශ්වවිද්‍යාලයේ විභාග අංශය මඟින් පවත්වනු ලබන සුදුසුකම් ලබා ගැනීමේ පරීක්ෂණයෙන් සමත් වීම)

**2. පාඨමාලාවේ ස්වභාවය**

- **පාඨමාලා කාල සීමාව** : අධ්‍යයන වර්ෂ එකකි (සමාසික දෙකකි)
- **දේශන සැලසුම** : සතිඅන්තයේ සහ රජයේ නිවාඩු දිනවල
- **දේශන මාධ්‍ය** : සිංහල සහ ඉංග්‍රීසි (මාධ්‍ය දෙකෙන් කණ්ඩායම් දෙකකි)
- **පාඨමාලා ගාස්තුව** : රු.200,000.00 (එක්වර ගෙවිය නොහැකි නම් මාස 3ක් ඇතුළත වාරික 2ක් වශයෙන් ගෙවා නිම කළ හැකිය)
- **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2023 ඔක්තෝබර් 24**

**3. අයදුම්පත් ලබාගැනීම**

අයදුම්පත් කාර්යාලයෙන් ලබාගැනීම සඳහා රු.2000/- ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවකින් යොමු අංක 322052400000016 (ගිණුම් අංකය ලෙස භාවිතා කරන්න) යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට බැරවන සේ ගෙවා ලබාගත් ලදුපතෙහි පිටුපස පාඨමාලාවේ නම සහ අයදුම්කරුගේ ලිපිනය පැහැදිලිව සඳහන් කර අයදුම්කරුගේ නම හා ලිපිනය ලියූ රු.110/- ක මුද්දර ඇලවූ 9" X 4" ප්‍රමාණයේ ලිපි කවරයක් සමඟ **නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, නො.115, ශ්‍රී ධර්මාරාම මාවත, කොටුව, මාතර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2023 ඔක්තෝබර් 20** දිනට පෙර එවිය යුතුය. මීට අමතරව අයදුම්පත් රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ වෙබ් අඩවියෙන් භාගත කිරීම ද (Download ) කළ හැකිය (මේ සඳහා www.fgs.ruh.ac.lk වෙත පිවිසෙන්න). මෙම භාගත කරන ලද අයදුම්පත් ද ඉහත අයුරින් රු.2000.00 ගෙවූ ලදුපත සමඟ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සම්පූර්ණ කළ අයදුම්පත් එවීමේදී ලිපියේ වම්පස ඉහළ කෙළවරේ "ආර්ථික විද්‍යාව පශ්චාද් උපාධි පාඨමාලාව" ලෙස සඳහන් කළ යුතුය.

ලේඛකාධිකාරී,
රුහුණ විශ්වවිද්‍යාලය
2023.09.24